## මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සුභ සාධක සංගමයේ ව්‍යවස්ථාව

## (2019.12.09 දින පැවති මහ සභා රැස්වීමේදී සිදුකළ සංශෝධන ද සහිතයි)

**01. හැඳින්වීම.**

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වන පරිදි පිහිටුවා ගත් මෙම සුභ සාධක සංගමය "මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සුභ සාධක සංගමය" ලෙස හඳුන්වනු ලැබේ.

**02. කාර්යාලීය ලිපිනය.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල.

**03. පරමාර්ථ හා සේවාවන්.**

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සුභ සාධක සංගමයේ සාමාජිකත්වය ලබා ඇති සියලුම සාමාජික සාමාජිකාවන් අතර සුහදතාවය වර්ධනය කිරීම, එය මනාව පවත්වාගෙන යාම සහ ඔවුන්ගේ සුභ සාධනය ප්‍රධාන පරමාර්ථයන් වේ. එකී පරමාර්ථ සාධනය කරනු වස් පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

1. අන්‍යෝන්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යාම.
2. සාමාජිකයන් සඳහා ක්‍රීඩා හා පුස්තකාල පහසුකම් සංවර්ධනය
3. අවමංගල්‍යාධාර ක්‍රමයක් ඇති කිරීම.
4. ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම
5. වාර්ෂික සුහද හමුවක් පැවැත්වීම
6. දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ වෙනුවෙන් දීමනා ලබාදීම
7. මරණයකදී, බරපතල තත්වයේ අසනීපයකදී හෝ හදිසි සැත්කමකදී ආධාර / ණය මුදල් ලබාදීම
8. සාමාජිකයන්ට අර්ථදායක වූ වෙනත් සුභ සාධක පහසුකම් ඇති කිරීම.

**3.1 අන්‍යෝන්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යාම.**

3.1.1 ස්ථාන මාරු ලබා යන සාමාජික සාමාජිකාවන් සඳහා සමු ගැනීමේ සාද පැවැත්වීම.

සුභ සාධක සංගමයේ සාමාජිකත්වය ලබා ඇති නිලධාරියෙකු / නිලධාරිනියක ස්ථාන මාරු ලබා යන අවස්ථාවකදී පහත සඳහන් පරිදි සංගමයේ අරමුදල් වැය කොට සමු ගැනීමේ සාද පවත්වා සමරු තිළිණයක් පිළිගැන්විය යුතුයි. දෙනු ලබන සමරු ඵලකය සඳහා වැය වන මුදල නිලධාරියාට ලබාදෙනු ලබන සමරු තිළිණයෙහි මුදලින් අඩු නොකළ යුතුයි. එම මුදල සංගමයේ අරමුදලින් දැරිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (අ) | සාමාජිකත්වය ලබා මාස 06 හෝ 06 ට වැඩි අවු: 01 හෝ 01 ට අඩු | - | රු: 4,000.00 |
| (ආ) | සාමාජිකත්වය ලබා අවු: 01 ට වැඩි හා අවු : 02 හෝ 02 ට අඩු | - | රු: 6,000.00 |
| (ඇ) | සාමාජිකත්වය ලබා අවු: 02 ට වැඩි හා අවු : 05 හෝ 05 ට අඩු | - | රු: 8,000.00 |
| (ඈ) | සාමාජිකත්වය ලබා අවු: 05 ට වැඩි හා අවු : 10 හෝ 10 ට අඩු | - | රු: 11,000.00 |
| (ඉ) | සාමාජිකත්වය ලබා අවු: 10 ට වැඩි | - | රු: 15,000.00 |

3.1.2 විශ්‍රාම ලබා යන සාමාජික සාමාජිකාවන් සඳහා සමුගැනීමේ සාද පැවැත්වීම.

සංගමයේ සක්‍රීය සාමාජිකයකු විශ්‍රාම ලබා යන අවස්ථාවකදී පහත සඳහන් පරිදි සංගමයේ අරමුදල් වැය කොට සමු ගැනීමේ සාද පවත්වා සමරු තිළිණයක් පිළිගැන්විය යුතුය. දෙනු ලබන සමරු ඵලකය සඳහා වැය වන මුදල නිලධාරියාට ලබාදෙනු ලබන සමරු තිළිණයෙහි මුදලින් අඩු නොකළ යුතුයි. එම මුදල සංගමයේ අරමුදලින් දැරිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (අ) | සාමාජිකත්වය ලබා මාස 06 හෝ 06 ට වැඩි අවු: 01 හෝ 01 ට අඩු | - | රු: 5,000.00 |

(ආ) සාමාජිකත්වය ලබා අවු: 01 ට වැඩි හා අවු : 02 හෝ 02 ට අඩු - රු: 8,000.00

(ඇ) සාමාජිකත්වය ලබා අවු: 02 ට වැඩි හා අවු : 05 හෝ 05 ට අඩු - රු: 10,000.00

(ඈ) සාමාජිකත්වය ලබා අවු: 05 ට වැඩි හා අවු : 10 හෝ 10 ට අඩු - රු: 13,000.00

(ඉ) සාමාජිකත්වය ලබා අවු: 10 ට වැඩි - රු: 20,000.00

3.1.3.ඉහත 3.1.1 හා 3.1.2 යන අවස්ථාවලදී සංග්‍රහ කටයුතු සඳහා **රු: 4,000.00 ක** උපරිමයකට යටත්ව සංගමයේ අරමුදලින් වියදම් දැරීමට හැකිය.

**3.2 ක්‍රීඩා හා පුස්තකාල පහසුකම් ඇති කිරීම**

සෑම සාමාජික සාමාජිකයකුටම සාමාජිකත්වය ලද දින සිටම මෙම පහසුකම් භුක්ති විදීමට අවස්ථාව සැලසේ.

3.2.1 පුස්තකාල පොත් පරිහරණය කිරීමේදී පහත කොන්දේසි වලට එකහව කයුතු කළ යුතුය.

- ❖ ලබාගත් පොතක් සති 02ක් තුළ නැවත භාර දිය යුතු අතර ප්‍රමාද වන සෑම දිනකටම රු: 5/= බැගින් වූ දඩ මුදලක් අය කෙරේ.
- ❖ ලබා ගත් පොතක් අස්ථාන ගතවී නම් එහි වටිනාකම හෝ වටිනාකමට සරිලන පොතක් ලබා දිය යුතුය.

**3.3 අවමංගල්‍යාධාර ක්‍රමයක් ඇති කිරීම.**

3.3.1 සංගමයේ සාමාජිකත්වය ලබා මාස 06ක් ඉකුත්වූ සෑම සාමාජිකයෙකුටම අවමංගල්‍යාධාර ප්‍රතිලාභ හිමිකම ලැබේ.

3.3.2 එකී ප්‍රතිලාභ පහත සඳහන් පරිදි ගෙවනු ලැබේ.

(අ) සාමාජිකයාගේ මරණයකදී - රු: 40,000.00

(ආ) කලත්‍රයාගේ මරණයකදී - රු: 30,000.00

(ඇ) සාමාජිකයාගේ මව / පියා, අවිවාහක දරුවන් - රු: 30,000.00

(ඈ) කලත්‍රයාගේ මව / පියා
අවිවාහක සාමාජිකයකු නම් අවිවාහක සහෝදර සහෝදරියන් - රු: 30,000.00

3.3.3 අවමංගල්‍ය උත්සවයට සහභාගී වීමට නොහැකි නම්, දානමය පිංකමට සහභාගී වීමේදී ඒ වෙනුවෙන් දැරීමට සිදුවෙන ගමන් ගාස්තු (වාහන කුලිය) සියලු සාමාජිකයින්ගෙන් සමානව අය කරනු ලැබේ. සාමාජිකයන්ට පහසුවන පරිදි අවශ්‍ය අවස්ථාවෙදී ගරු භාණ්ඩාගාරික විසින් ගමන් ගාස්තුව සංගමයේ අරමුදලින් දරනු ලබන අතර පසුව එළඹෙන පළමු වැටුප් දිනයේදීම සංගමයට එම මුදල ප්‍රතිපූර්ණය කිරීමට සාමාජිකත්වය බැඳී සිටී.

*සැ.යු.* ***අවමංගල්‍ය උත්සවයට යම් සාමාජිකයෙකු පෞද්ගලිකව සහභාගී නොවුවත් පොදුවේ මෙම ගමන් ගාස්තුව ගෙවීමට බැඳී සිටී.***

**3.4 ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම**

3.4.1 සංගමයේ ණය මුදල රු: 250,000.00කින් සමන්විත වන අතර, වරප්‍රසාද හිමි සෑම සාමාජිකයෙකුටම ණය මුදලක් ලබා ගැනීමට හිමිකම් ලැබෙනු ඇත.

3.4.2 වරකට ලබාගත හැකි උපරිම ණය මුදල රු: 15,000.00කි. එම ණය මුදල 1.5%ක මාසික පොලියක්ද සමග සමාන වාරික දහයකින් (10) අඛණ්ඩව ගෙවා නිම කළ යුතුය.

3.4.3 ණය සඳහා ඉල්ලුම් කරන සාමාජිකයින් අතුරින් ඉල්ලුම් කරන අනුපිළිවෙලට අනුව ණය නිකුත් කිරීම කරනු ලැබේ.

3.4.4 ලබාගත් ණය මුදලක් ගෙවා නිම කෙරෙන තුරු අලුතින් ණය මුදලක් ලබා ගැනීමට හිමිකමක් නොලැබෙනු ඇත.

3.4.5 ණය ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා සංගමය විසින් පිළියෙල කර ඇති ණය ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතු අතර ණයකරු වෙනුවෙන් සංගමයේ සාමාජිකයින් දෙදෙනෙකු ඇපකරුවන් වශයෙන් අත්සන් කළ යුතුය. ඇපකරුවන් දෙදෙනා අනිවාර්යයෙන්ම මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැටුප් ලේඛණයෙන් වැටුප් ලබන්නන් විය යුතුය.

3.4.6 සාමාජිකත්වය ලබා මාස 06ක් ඉක්මවා හා අඛණ්ඩව සාමාජික මුදල් ගෙවා ඇති සාමාජිකයන්ට පමණක් ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට හිමිකම් ඇත.

**3.5 වසරකට වරක් සුහද හමුවක් පැවැත්වීම**

වසරකට වරක් සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුලවල අය පමණක් සහභාගී වී විශේෂ සුහද හමුවක් පැවැත්වීම හෝ විනෝද චාරිකාවක් යාම. ඒ වෙනුවෙන් සංගමය දරන මුදල මහ සභාවකින් තීරණය කළ යුතුය.

**3.6 දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ වෙනුවෙන් දීමනා ලබාදීම**

සංගමයේ සාමාජිකත්වය ලබා මාස 06 ඉක්මවූ සාමාජික/සාමාජිකාවන්ගේ දරුවන්ට මෙම ප්‍රතිලාභ ලැබීම සඳහා හිමිකම ලැබේ.

3.6.1 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් සඳහා දීමනා ලබාදීම

ඉහත පරිදි සංගමයේ සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයෙකුගේ / සාමාජිකාවකගේ දරුවකු ශිෂ්‍යත්ව විභාගය සමත් වූ විට රු: 5,000.00 ක දීමනාවක් ගෙවීම. මෙම ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා අදාළ ඉල්ලීම් ලිපිය සමග කඩඉම් ලකුණු සහ දරුවාගේ ප්‍රතිඵල දැක්වෙන ලේඛණය ඉදිරිපත් කළ යුතුයි.

3.6.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් දරුවන් සඳහා දීමනා ලබාදීම

ඉහත පරිදි සංගමයේ සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයෙකුගේ / සාමාජිකාවකගේ දරුවකු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීමේදී ලබාගනු ලබන A සාමාර්ථ සඳහා පහත සඳහන් සීමාවන්ට යටත්ව පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

I. අනිවාර්යයෙන්ම අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුයි.

II. අවම වශයෙන් A සාමාර්ථ 05 ක් ලබාගෙන තිබිය යුතුයි.

මෙම සුදුසුකම් දෙක සපුරා ඇති නම් අවම වශයෙන් A සාමාර්ථ 05 ක් ලබාගෙන තිබේ නම් රු: 5,000.00 ක මුදලක්ද වැඩි වන A සාමාර්ථයක් සඳහා රු: 1,000.00 බැගින් උපරිම මුදල රු: 9,000.00 ක් දක්වා ගෙවීම් කරනු ලැබේ.

මෙම ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා අදාළ ඉල්ලීම් ලිපිය සමග දරුවාගේ ප්‍රතිඵල දැක්වෙන ලේඛණය ඉදිරිපත් කළ යුතුයි.

3.6.3 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් දරුවන් සඳහා දීමනා ලබාදීම

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් රජයේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් වීමට සුදුසුකම් ලබන දරුවන් සඳහා රු: 12,000.00 ක දීමනාවක් ගෙවීම.

මෙම ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා අදාළ ඉල්ලීම් ලිපිය සමග දරුවාගේ ප්‍රතිඵල දැක්වෙන ලේඛණය සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් බවට අදාළ විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරන ලද ලිපිය ඉදිරිපත් කළ යුතුයි.

**3.7 මරණයකදී, බරපතල තත්වයේ අසනීපයකදී හෝ හදිසි සැත්කමකදී ආධාර / ණය මුදල් ලබාදීම**

මෙම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට නම් සාමාජිකත්වය ලබා මාස 06ක් ඉක්මවා තිබිය යුතු වන අතර අඛණ්ඩව සාමාජික මුදල් ගෙවා තිබිය යුතුයි.

3.7.1 බරපතල තත්වයේ අසනීපයකදී ආධාර මුදලක් ලබාදීම

පහත දක්වා ඇති කුමන හෝ ගනයකට අයත් පුද්ගලයෙකු අසාධ්‍ය තත්වයේ අසනීපයකට මුහුණ පා ඇති අවස්ථාවකදී සුභ සාධක සංගමයේ විශේෂ රැස්වීමක් කැඳවා සංගමයේ පවතින මූල්‍ය තත්වය, සාමාජිකයාගේ ආර්ථික තත්වය සහ අසනීපයේ තත්වය සලකා බලා බහුතර සාමාජික කැමැත්ත මත අවස්ථානුකූලව සාකච්ඡා කර තීරණය කරනු ලබන මුදලක් සාමාජිකයාට සහනයක් සැලසීම වෙනුවෙන් ආපසු අය කර නොගැනීමේ අරමුණින් යුතුව අධාර මුදලක් වශයෙන් ලබාදීම. මෙලෙස ලබාදෙනු ලබන ආධාර මුදල රු: 20,000.00 නොඉක්මවිය යුතුයි.

- ✓ සාමාජිකයා,
- ✓ විවාහක සාමාජිකයෙකු නම් කලත්‍රයා, අවිවාහක දරුවන්
- ✓ අවිවාහක සාමාජිකයෙකුනම් සාමාජිකයාගේ මව, පියා

මෙහිදී අදාළ වෛද්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.

3.7.2 මරණයකදී හෝ හදිසි සැත්කමකදී පොලී රහිත විශේෂ ණය මුදලක් ලබාදීම

(අ) පහත දක්වා ඇති කුමන හෝ ගනයකට අයත් පුද්ගලයෙකුගේ මරණයකදී අවශ්‍ය නම් රු: 15,000.00 ක උපරිමයක් දක්වා පොලී රහිත විශේෂ ණය මුදලක් ලබාදීම.

- ✓ සාමාජිකයාගේ මව, පියා
- ✓ විවාහක සාමාජිකයෙකු නම් කලත්‍රයා, කලත්‍රයාගේ මව, පියා, අවිවාහක දරුවන්
- ✓ අවිවාහක සාමාජිකයෙකුනම් අවිවාහක සහෝදර සහෝදරියන්

(අ) පහත දක්වා ඇති කුමන හෝ ගනයකට අයත් පුද්ගලයෙකුගේ හදිසි සැත්කමකදී එනම් හෘද රෝග, වකුගඩු රෝග, බරපතල තත්වයේ හදිසි අනතුරු වැනි අවස්ථාවකදී අවශ්‍ය නම් රු: 15,000.00 ක උපරිමයක් දක්වා පොලී රහිත විශේෂ ණය මුදලක් ලබාදීම.

- ✓ සාමාජිකයා
- ✓ සාමාජිකයාගේ මව, පියා
- ✓ විවාහක සාමාජිකයෙකු නම් කලත්‍රයා, කලත්‍රයාගේ මව, පියා, අවිවාහක දරුවන්
- ✓ අවිවාහක සාමාජිකයෙකුනම් අවිවාහක සහෝදර සහෝදරියන්

මේ සඳහා ඉල්ලීම් ලිපියක් සමග පිළිගත හැකි මට්ටමේ වෛද්‍ය සහතිකයක් සුභ සාධක සංගමය වෙත ඉදිරිපත් කළ යුතුයි. මෙලෙස ලබාදෙන ණය මුදල සමාන වාරික 10 කින් ගෙවා නිම කළ යුතුයි.

මේ සඳහා රු:50,000.00 ක සංචිතයක් පවත්වාගෙන යාම.

**3.8 සාමාජිකයන්ට අර්ථදායක වූ වෙනත් සුභසාධන පහසුකම් ඇති කිරීම**

ඉහත අංක 3.1 සිට 3.7 දක්වා සුභසාධන සේවාවන්ට අමතරව සාමාජිකයින්ගේ සුභසාධනය සඳහා ඉවහල් වේ යැයි අදහස් කරන වෙනත් සුභසාධන සේවාවන් මේ යටතේ ඇති කළ හැකිය.

**04. සාමාජිකත්වය ලබා ගැනීම.**

4.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පරිශ්‍රයේ ඇති සියලුම කාර්යාලවල සේවයේ නියුක්ත නිළධාරීන්ට පමණක් මෙම සංගමයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකියි.

4.2 සාමාජිකත්වය ලබා ගැනීම සඳහා රු: 500.00ක් ඇතුළත් වීමේ ගාස්තුව වශයෙන් ගෙවිය යුතුයි.

4.3 2020.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් එක් සාමාජිකයා විසින් මාසික සාමාජික ගාස්තු වශයෙන් රු: 200.00 ක මුදලක් ගෙවිය යුතුය.

4.4 සාමාජිකත්වය ලබා ගැනීමේදී සංගමයේ ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කරන බවත්, එක් එක් සාමාජිකයාගෙන් සංගමයට අයවිය යුතු සියළුම මුදල් තම මාසික වැටුපෙන් අඩුකර ගැනීම සඳහා බලය දුන් ගිවිසුමකට එළඹිය යුතුය.

**05. සාමාජිකත්වය අහිමිවීම**

5.1 සාමාජිකයෙක් මියයෑම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම, රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම, සාමාජිකයා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් පිටත පිහිටි කාර්යාලයකට ස්ථානමාරු වී යාම, මාසික සාමාජික මුදල් පිළිවෙලින් මාස තුනක් (03) නොගෙවා තිබීම, සුභ සාධක සංගමයේ මහ සභා රැස්වීම් වාර තුනකට (03) අඛණ්ඩව සහභාගි නොවීම යන අවස්ථාවන්හිදී සාමාජිකත්වය අහිමි වේ.

සාමාජිකයා කෙටි කාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් පිටතට ස්ථාන මාරු වීමක් ලබාගෙන යන්නේ නම් එහිදී ඔහුගේ සාමාජිකත්වය අහිමි වන අතර නැවත කාර්යාල සංකීර්ණය වෙත ස්ථාන මාරුවක් ලබාගෙන පැමිණියහොත් නව සාමාජිකයෙකු වශයෙන් නැවත සාමාජිකත්වය ලබාගත යුතුයි.

5.2 සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන, සාමාජික මුදල් නොගෙවීමෙන් හා සංගමයේ රැස්වීම් වාර තුනකට (03) නොපැමිණීමෙන් සාමාජිකත්වය අහිමිවන සාමාජිකයන්ට කිසිදු ප්‍රතිලාභයක් සඳහා හිමිකමක් නොමැත.

**06. සංගමයේ අරමුදල**

6.1 සංගමයේ අරමුදල් සාමාජිකයන්ගෙන් අය කරනු ලබන මාසික සාමාජික ගාස්තු වලින් ඇතුළත්වීමේ ගාස්තු වලින්ද, ආධාර හා වෙනත් සුදුසු මාර්ගවලින් ද උපයා ගන්නා ලද මුදලින් ද සමන්විත විය යුතුයි.

6.2 සුභසාධක සංගමය වෙනුවෙන් මොනරාගල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුමට පහත සඳහන් මුදලක් තැන්පත් කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ආපසු ලබා ගැනීමේ බලය සංගමය සතුවේ.

6.3 සංගමයේ අරමුදලින් රු.10,000.00කට නොවැඩි මුදලක් සංගමයේ හදිසි අවශ්‍යතා සඳහා තමා වෙත රඳවා ගැනීමට භාණ්ඩාගාරිකට බලය ඇත.

**07. බැංකුවෙන් මුදල් ආපසු ලබා ගැනීම**

7.1 ඉහත අංක 03 ඡේදයේ අවශ්‍යතා සපුරා ගැනීමට සංගමයේ මුදල් පරිහරණය කළ යුතුය. ඒ සඳහා අරමුදල් ආපසු ලබා ගන්නා අවස්ථාවන්හිදී සංගමයේ භාණ්ඩාගාරික, සභාපති හා ලේකම් යන නිලධාරින්ගෙන් දෙදෙනෙකුගේ අත්සනින් යුතුව මුදල් ලබා ගැනීමට බලය ඇත.

**08. වියදම් අනුමත කිරීම**

සංගමය විසින් දැරීමට සිදුවන සියළුම වියදම් කාරක සභාව විසින් අනුමත කළ යුතුවේ.

**09. මුදල් වර්ෂය**

සංගමයේ මුදල් වර්ෂය ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා විය යුතුය.

**10. නිලධාරීන්**

සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීමකදී පහත සඳහන් නිලධාරීන් හා කමිටු සාමාජිකයින් තෝරා පත් කරගත යුතුය.

1. සභාපති (නිල බලයෙන්ම දිස්ත්‍රික් ලේකම්තුමා සංගමයේ සභාපති වන්නේය)
2. උප සභාපති
3. ලේකම්
4. උප ලේකම්
5. භාණ්ඩාගාරික
6. ගණන් පරීක්ෂක
7. කාරක සභිකයින් 06
8. ප්‍රධාන සංවිධායක
9. පුස්තකාල ලේකම්
10. ක්‍රීඩා ලේකම්

**11.** **නිලධාරී මණ්ඩලයේ නිල කාලය**

සංගමයේ නිලධාරී මණ්ඩලයේ නිල කාලය අවු. 01ක් වන අතර, ඊළඟට පවත්වනු ලබන මහ සභා රැස්වීමකදී නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගත යුතුය. නව නිලධාරී මණ්ඩලය පත් කරන තෙක් සිටි නිලධාරී මණ්ඩලය කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේය.

**12.** **සංගමයේ රැස්වීම**

**12.1** **වාර්ෂික මහ සභා රැස්වීම**

(අ) සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීම යටත් පිරිසෙයින් සාමාජිකයින් වෙත දෙසතියක දැනුම් දීමකින් පසුව මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව එළඹෙන ජනවාරි මස පැවැත්විය යුතුය.

(ආ) සතියකට පෙර සාමාජිකයින් අතර බෙදා හරින ලද පසුගිය වර්ෂයේ කටයුතු පිළිබඳ වාර්තාවක් හා ගිණුම් කටයුතු පිළිබඳ ගණන් පරීක්ෂක වාර්තාවක්ද එම රැස්වීම්වලදී ඉදිරිපත් කළ යුතුය.

I. නව නිලධාරීන් මණ්ඩලයක් පත් කර ගැනීම
II. ව්‍යවස්ථා සංශෝධනය කිරීම

**12.2** **මහ සභා රැස්වීම**

(අ) මාස 03කට වරක් මහ සභා රැස්වීම් පැවැත්විය යුතුය. එය සියළුම සාමාජිකයින්ගේ යුතුකම වන්නේය.

(ආ) සාමාජිකත්වය 2/3ක ලිඛිත ඉල්ලීම මත මහ සභා රැස්වීමක් කැඳවීමේ බලය ලේකම් සතු වන්නේය.

**12.3** **කාරක සභාව රැස්වීම**

මෙම රැස්වීම යටත් පිරිසෙයින් සංගමයේ නිලධාරීන් වෙත දින 03කට පෙර දැනුමදීමකින් පසු මසකට වරක් පැවැත්විය යුතුය. සංගමයේ විශේෂ හේතූන් මත මසක් ඉකුත්වීමට පෙර වුවද කාරක සභා රැස්වීමක් කැඳවීමේ බලය ලේකම් සතු වේ.

**13.** **රැස්වීම් සඳහා ගණ පූර්ණය**

13.1 වාර්ෂික මහ සභා රැස්වීම් සහ මහ සභා රැස්වීම් සඳහා සංගමයේ නිත්‍ය සාමාජිකයින් සංඛ්‍යාවෙන් 2/3 ක් විය යුතුයි.

13.2 කාරක සභා රැස්වීම් සඳහා ගණ පූර්ණය සංගමයේ නිලධාරී මණ්ඩලයෙන් 2/3ක් විය යුතුය.

**14.** **ව්‍යවස්ථා සංශෝධනය**

ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ඇති වුවහොත් වාර්ෂික මහ සභා රැස්වීමකදී සංගමයේ පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් 2/3ක කැමැත්ත ලැබිය යුතුය.

**15.** සුභ සාධක සංගමයේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සියලුම සාමාජික සාමාජිකාවන් කටයුතු කිරීමට බැඳී සිටී.

ගරු සභාපති,
ඩී. එස්. පත්මකුලසූරිය.
(දිස්ත්‍රික් ලේකම් / දිසාපති)

ගරු ලේකම්
කේ.එම්.සී. ජගත් කෝණාර.